**මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ අවසානය දිනට පළාත් භාණ්ඩාගාරා දෙපාර්තුමේන්තුවෙන් දේපල පැවරීම, දැවැදි සහ පරිත්‍යාග මත අයකළ යුතු හිඟ මුද්දර ගාස්තු රු1,300,000 කින් මූල්‍ය ප්‍රකාශනවලින් වැඩියෙන් දක්වා තිබුණි. | පොත්පත් සහ ලිපි ලේඛන පදනම් කර ගනිමින් හිඟ මුදල් ගිණුම්ගත කළ යුතු වීම. | ප්‍රාදේශීය සභාව විසින් මූල්‍ය දක්වා ඇති හිඟ මුද්දර ගාස්තු රු.5,367,150 කි. මෙය ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලද තොරතුරු අනුව පිළියෙල කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් මුද්දර ගාස්තු මත ලබා දී තිබූ වට්ටම් රු.85,332 ක් ගිණුම්වල දක්වා නොතිබුණි. | නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. | ඉදිරි මූල්‍ය වර්ෂවල ගණනය කර ගිණුම් පිළියෙල කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) | මුද්දර ගාස්තු වූ කලී ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු ආදායමකි. එසේ වුවත්, 2018 වර්ෂයේදී නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තුමේන්තුවෙන් වැඩිපුර අයකළ රු.110,000 ක මුද්දර ගාස්තු විගණන දිනය වන 2019 මාර්තු 31 දින වන විටත් සභාවට ලැබී නොතිබුණු අතර මෙම මුදල ගිණුම්ගත කර ද නොතිබුණි. | නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තුමේන්තුවට මෙම අය කිරීම පිළිබඳව දැනුවත් කර මුද්දර ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු වීම. | මුද්දර ගාස්තු ලැබු වහාම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |

**1.3.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම**

**තොරතුරු ඉදිරිපත් කර නොතිබීම**

පහත දැක්වෙන රු.195,232,508 ක් වටිනා ගිණුම් විෂයයන් 06 ක් ඉදිරියෙන් සඳහන් කර ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස ඒවා සන්නිරීක්ෂණය කළ නොහැකි වීම.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (i) | ඉඩම් හා ගොඩනැගිලි | 182,319,063 | ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් ශේෂ තහවුරු කිරීමේ සාක්ෂි හා ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනය අප සතුව තිබුණද එය යාවත් කාලීන කර නොතිබුණි. දැන් යාවත් කාලින කිරීම සඳහා කටයුතු කර ඇත. |
| (ii) | යන්ත්‍රෝපකරණ | 3,005,923 | වත්කම් ලේඛන, අයිතිය තහවුරු කිරීමේ ලේඛන | | |
| (iii) | මෝටර් රථ හා කරත්ත | 11,750,000 | වත්කම් ලේඛන, අයිතිය තහවුරු කිරීමේ ලේඛන | | |
| (iv) | විදුලිය ගබඩා උපකරණ වල තොග | 48,216 | තොග ලේඛන | | |
| (v) | ජල නල සවි කිරීම් | 1,993,786 | තක්සේරු වාර්තා, කාර්මාන්තය අවසන් කළ බවට වාර්තා සහ ගෙවීම් වවුචර | | තක්සේරු වාර්තා, කාර්මාන්තය අවසන් කළ බවට වාර්තා සහ ගෙවීම් වවුචර සහ ජාතික ජල සම්පාදන හා මලාපවාහන |

මණ්ඩලයෙන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීම සඳහා පියවර ගෙන ඇත.

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්තිය සහ පළාත් පාලන නිවාස ඉදිකිරීම් හා කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 දිනැති අංක 488/16 දරන ගැසට් නිවේදනයේ 31(1) උප වගන්තිය | ප්‍රාදේශීය සභාවල කාර්යයන් පහසු කිරීමේ අරමුණින්, සම්පූර්ණ තීරණ ලබාගැනීම සඳහාත්, සභාවේ මූල්‍ය, ප්‍රතිපත්තිමය සැලසුම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධනය, තාක්ෂණික සේවාවන්, පාරිසරික හා පොදු පහසුකම් වැනි විෂයයන් සඳහා වෙන වෙනම කමිටු ස්ථාපිත කර උපදෙස් ලබාගත යුතුය. එසේ වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම කමිටු පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර කමිටු ස්ථාපිත කර ඒවා විධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක කර උපදෙස් ලබා දිය යුතුය. | ප්‍රාදේශිය සභාව විසින් ස්ථාපිත කළ මෙම කමිටු 2019 වර්ෂයේ සිට විධිමත්ව ක්‍රියාත්මක වන බව දැනුම් දෙමි. |
| (ආ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ I හි 193 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමග සසඳා විචල්‍යයන් සඳහා පැහැදිලි කිරීම් අඩංගු ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ නොතිබුණි. | ප්‍රකාශයන් නියමිත කාලය තුළ පිළියෙල කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රාදේශිය සභාවේ මූල්‍යය හා පරිපාලන රීති වලට අනුකූලව ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා කටයුතු කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | IAI/2002/02 දරන 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාරා චක්‍රලේඛනය | පරිගණක හා පරගණක උපකරණ හා මෘදුකාංග ලේඛනගත කිරිම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛයට අනුව ක්‍රියා කළ යුතු වීම. | වෙනමම ලේඛන 2019 වර්ෂයේ සිට නඩත්තු කිරීමට කටයුතු කෙරේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,357,433 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,410,502 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,946,931 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 660,350 | 784,780 | 709,375 | 75,405 | 660,350 | 650,350 | 515,920 | 134,430 |
| කුලී | 924,450 | 1,060,498 | 1,060,498 | - | 954,600 | 804,600 | 804,600 | - |
| බලපත්‍ර ගාස්තු | 1,145,450 | 691,655 | 691,655 | - | 1,145,600 | 1,156,585 | 1,156,585 | -- |
| අනෙකුත් ආදායම් | 45,924,500 | 57,679,812 | 46,815,262 | 10,864,550 | 43,562,200 | 50,954,310 | 39,109,079 | 11,845,231 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

### 2.2.2.1 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 හා 140(1) වගන්තිවලට අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින කොට්ඨාශවලින් ද වරිපනම් බදු අයකළ යුතුය. එසේ වුවත්, සභාව විසින් තාවකාලික වරිපනම් බදු පමණක් අයකරනු ලබන අතර දේපල වටිනාකම් තක්සේරු කර වරිපනම් බදු ස්ථිර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වරිපනම් බදු තාවකාලික පදනම මත අය කරනු ලැබේ. වරිපනම් බදු දේපල වටිනාකම් මත තක්සේරු කිරීම් සිදුකර ස්ථාවර කිරීමට වර්තමානයේ කටයුතු ආරම්භ කර ඇත. ඉන් පසුව, සභාවේ ආදායම් වැඩි විය හැකි බව අපේක්ෂා කෙරේ. |

## 2.2.3 අනෙකුත් ආදායම්

### JCB යන්ත්‍රයේ භාවිතය

තම ප්‍රාදේශීය සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF) යටතේ JCB යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2017 පෙබරවාරි මාසයේදී ඉහත අරමුදල සමඟ ගිවිසුම්ගතව අදාළ යන්ත්‍රය මිලදී ගෙන තිබුණි. මෙම යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැති වීමෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදල යටතේ ණයක් ලබා මෙම JCB යන්ත්‍රය මිලදී ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව සභාවේ අරමුදලින් රු.2,300,000 ක් සහ ණය අරමුදල මඟින් රු.9,200,000 ක් වශයෙන් එකතුව රු.11,500,000 කට සභාවේ ආදායම් වැඩි කිරීමේ අපේක්ෂාවෙන් මෙම යන්ත්‍රය මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, මෙම යන්ත්‍රය භාවිතා කිරීම හේතුවෙන් සභාව පාඩු පමණක් උපයාගෙන තිබුණි. | මෙවැනි යන්ත්‍ර මිලදී ගැනීමේදී අනාගතයේදී සභාවට ලැබෙන ආදායම් හා එමඟින් වන සංවර්ධනයන් පිළිබඳ අධ්‍යයනයකින් පසුව මිලදී ගැනීම යෝග්‍ය වේ. | ආදායම් වැඩිකිරීම සඳහා කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මෙම යන්ත්‍රය පුද්ගලික කාර්යයන් සඳහා සභාවේ කාර්යයන් සඳහා සහ උසස් බලධාරීන් විසින් පනවනු ලබන කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන නමුත් බොහෝ විට සභාපතිවරයාගේ හෝ ලේකම්වරයාගේ අනුමැතිය ලැබේ. අනෙකුත් වේලාවන්වලදී කිසිඳු අනුමැතියකින් තොරව අදාළ යන්ත්‍රය විවිධ කාර්යයන් සඳහා භාවිතා කරනු ලැබේ. මෙම යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විධිමත් සැලැස්මක්, අභ්‍යන්තර පාලනයන් සහ වාර්තාවන් සකස් කිරීමක් වැනි කාරණා නිසි අයුරින් ක්‍රියාත්මක කර නොතිබුණි. | භාවිතා කිරීම සඳහා අදාළ අනුමැතීන් ලබාගත යුතුය. | අභ්‍යන්තර පාලනයක් නොමැති වීම සභාවේ විශාල අඩුපාඩුවකි. මෙම අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |

## 2.2.4 මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල්

-----------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.847,800 ක් සහ මුද්දර ගාස්තු රු.4,135,196 ක් ලැබිය යුතුව තිබුණි.

### (අ) උසාවි දඩ මුදල්

-------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ උසාවි දඩ මුදල් රු.847,800 ක් 2017 වර්ෂයේ ජුනි සිට දෙසැම්බර් මාසය දක්වා වූ හිඟ මුදල්ය. එසේ වුවත්, 2018 වර්ෂ අවසානය දක්වා වූ උසාවි දඩ මුදල් සම්පූර්ණයෙන් ලබාගැනීම සඳහා විගණන දිනය වන 2019 මැයි 08 දින වන විටත් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | උසාවි දඩ මුදල් ලබාගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ මුදල් ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

### (ආ) මුද්දර ගාස්තු

-----------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2017 සහ 2018 කාලපරිච්ඡේදය තුළ නිශ්චල දේපල පැවරීම මත මුද්දර ගාස්තු මඩකලපුව දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් එකරැස් කර නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයේ ආදායම් බදු දෙපාර්තමේන්තුවට දෙනු ලබන මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන විසින් ලබාගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | නැගෙනහිර පළාත් සභාවේ 2010 අංක 06 දරන මුද්දර ගාස්තු සංශෝධන 03 අනුව වාර්ෂිකව මුද්දර ගාස්තු අයකළ යුතුය. එසේ වුවත්, 2018 ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා කාල පරාසයට අදාළ මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අදාල කාල පරාසය තුළ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර අදාළ මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අදාල කාල පරාසය තුළ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, දැනට මුද්දර ගාස්තු සම්බන්ධ ලේඛන පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. |
| (ii) | නැගෙනහිර පළාත් පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින්, නැගෙනහිර පළාත් සභා 2008 වර්ෂයේ අංක 01 දරන බදු හා ගාස්තු පැනවීමටත් එක්රැස් කිරිමටත් මූල්‍ය පනතේ 37 වැනි පරිශිෂ්ඨය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින නිශ්චල දේපල පැවරීමේදී නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් 2016, 2017 හා 2018 දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ ඍජුව හා ජංගම සේවාවන් මඟින් මුද්දර ගාස්තු වැඩිපුර අය කරගෙන තිබුණි. 2018 වර්ෂයේ දී රු.110,000 ක් දේපල හිමියන් විසින් නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවනු ලැබූ මුද්දර ගාස්තු ගණනය කර අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නැගෙනහිර පළාත් සභාවේ 2008 අංක 01 දරන බදු හා ගාස්තු පැනවීමටත් එක්රැස් කිරිමටත් ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් නියමිත කාල පරිච්ඡේදය තුළ අයකිරීමට කටයුතු කළ යුතුය. | වැඩිපුර මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු යොදා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා

සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීමපිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ වියදමත් කිරීම් සඳහා ප්‍රධාන කාරණා 05 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතුව පැවතුණි. එසේ වුවත්, ප්‍රාදේශීය සභාව විසින් 2012 වර්ෂයේදී අතුරු ව්‍යවස්ථා පිළිබඳ අදහස් නැගෙනහිර පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යවා තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | අතුරු ව්‍යවස්ථා සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා පියවර ගෙන ඇත. |

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, සභාවේ ආදායම් ඉහළ නැංවීම සඳහා ප්‍රධාන කාරණා 13 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතුව පැවතුණි. එසේ වුවද, අනුමැතිය ලබාගැනීම සඳහා සකස් කළ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 13 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට කටයුතු කර ඇති බව කාරුණිකව දැනුම් දෙමි. |

**(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015 වර්ෂයේ තිරසාර සංවර්ධන සම්මේලනයේ තීරණයන්ට අනුකූලව කටයුතු සිදුකිරීම. | තිරසාර සංවර්ධන ඉලක්ක සැකසීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් 2016 වර්ෂයේදී රු.4,000,000 ක් සහ සමාලෝචිත වර්ෂයේදී රු.1,993,786 ක් වශයෙන් එකතුව රු.5,993,786 ක මුදලක් ජාතික ජල සම්පාදන හා මලාපවාහන මණ්ඩලයට පන්ඩාරියාවෙලි, කට්සේනෙයි සහ මාවඩි මුන්මාරි යන ප්‍රදේශවල පදිංචි පවුල්වලට ජලය ලබාගැනීම වෙනුවෙන් ලබා දී තිබුණි. එසේ වුවත්, විගණන දිනය වන 2019 අප්‍රේල් 30 දින වන විටත් මෙම ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ නොවීම හේතුවෙන් කිසිඳු වාර්තාවක් සභාව විසින් ජාතික ජලසම්පාදන හා මලාපවාහන මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි. | පොදු මහජනතාවට අවශ්‍ය සේවාවන් සම්පූර්ණ සම්පූර්ණ කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. | ජාතික ජලසම්පාදන මණ්ඩලයට සභාව මඟින් වාර්තා ලබාගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ සේවක සංඛ්‍යා ලැයිස්තුවට අනුව, පහත සඳහන් තනතුරුවලට ඉදිරියෙන් දක්වා ඇති පුරප්පාඩු හා අතිරික්ත සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් සභාව විසින් අවධානය යොමු කර ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මානව සම්පත් කළමනාකරණය පිළිබඳව විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතු වේ. | සභාව විසින් සන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු කඩිනමින් ඉටුකිරීම සඳහා අවශ්‍ය සේවක පුරප්පාඩු පවතින බැවින් වැඩ බැලීමේ පදනම මත සේවකයන් බඳවාගෙන තිබුණි. |
| (ii) | සභාවට අවශ්‍ය කම්කරුවන් සහ සෞඛ්‍ය සේවකයන් 08 දෙනෙකු පමණක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ නමුත් සභාව විසින් වැඩ බැලීමේ පදනම මත තවත් 13 දෙනෙකු බඳවාගෙන තිබුණි. | සභාවට අවශ්‍ය කම්කරුවන් සහ සෞඛ්‍ය සේවකයන් සම්බන්ධයෙන් විධිමත් මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබිය යුතුය. | |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් දේපල බදු දීමේදී බදු ගිවිසුමේ ඇප ලේඛන ලබාගත යුතු බව සඳහන් වුවද, එවැනි ලේඛන හෝ ඇප මුදල් ලබාගෙන නොතිබුණි. මේ නිසා, බදු පදනම මත දේපල ලබාගත් අය, බදු මුදල් ගෙවීම පැහැර හැරීමේදී සභාවට ආදායම් අහිමි විය හැකිය. | පනතේ විධිවිධාන අනුව ක්‍රියාකළ යුතුය. | සභාව සතු දේපල බදු දීමේදී ඇප මුදල් ලබාගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය අනුව, ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක ප්‍රතිශතයක බදු අයකළ යුතුය. එසේ වුවත්, 2017 සහ 2018 ජුනි මාසය අවසානය දක්වා කාල පරාසය තුළ විකුණනු ලැබූ ඉඩම්වල මුළු එකතුව | 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය අනුව, අයකිරීමට කටයුතු කළ යුතුය. | විකුණුම් මත 1% ක බදු අයකිරීමට කටයුතු කර ඇත. |

රු.55,248,300 ක් සඳහා බදු ලෙස රු.552,483 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. මේ නිසා, සභාව විසින් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.6,000,000 ක් අහිමි කිරීමට සිදු වී තිබේ.

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා පළාත් සභා සහ අමාත්‍යාංශය විසින් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් 2015 පෙබරවාරි 25 දින ප්‍රාදේශීය සභාවට ලබා දී තිබුණි. එසේ වුවත්, 2016 දෙසැම්බර් 06 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ යන්ත්‍රයේ එන්ජිම අකර්මන්‍ය වීම හේතුවෙන් සභා පරිශ්‍රයේ නවතා තිබුණි. මෙම යන්ත්‍රය අලුත්වැඩියා කර ආදායම් ඉපැයීමේ කාර්යයන් සඳහා යෙදවීමට ක්‍රියා නොකිරිමෙන් යන්ත්‍රය කිසිදු භාවිතයකින් තොරව සභාවේ පැවතුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීමට හා එහි පසුගිය කාල ආදායම් කෙරෙහි අවධානය යොමු කර කටයුතු කළ යුතු වේ. | මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සභාව සතු නොවීම නිසා මෙම යන්ත්‍රය අලුත්වැඩියා කර නොතිබූ බව කාරුණිකව දන්වා සිටිමි. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු වී නොතිබුණි. | විධිමත් අයුරින් සැලසුම් කර විගණන කටයුතු සිදුකළ යුතු වීම. | අභ්‍යන්තර විගණන කාර්යයන් මෙම වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විධිමත්ව සැලසුම් කර අභ්‍යන්තර විගණන කටයුතුවලට අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම වර්ෂයේ පළමු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2019 මැයි 02 දින පැවැත් වූ බව කාරුණිකව දන්වා සිටිමි. |

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. | චක්‍රලේඛ හා පනතේ විධිවිධානවලට අනුව ක්‍රියාකළ යුතුවීම. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදි පසුගිය වර්ෂවල තථ්‍ය වියදම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | අයවැය පිළියෙල කිරීමේදී පසුගිය කාලයේ තථ්‍ය වියදම් සැලකිල්ලට ගත යුතු වේ. | |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) සභාවේ භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීමටපියවර ගැනීම. | | |